# කල්පවත්නා ගොවි සංවිධාන ඇති කිරීමට නම්.....

ලාංකික ගොවියා නගා සිටුවීම සඳහා ගොවි සංවිධාන ඇති කළ යුතුය යන අදහස අද බොහෝ දෙනාගේ සාකච්ඡාවට භාජනය වී ඇති මාතෘකාවකි. කම්කරුවන්, ලිපිකරුවන්, ගුරුවරුන් මෙන් ගොවීන් ද තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සංවිධානය විය යුතුය යි ඇතමුන් අදහස් කරන අතර ගොවියා අතරමැදි ජාවාරම්කරුවන්ගෙන් මුදවා ඔහුගේ නිෂ්පාදනවලට හොඳ මිළක් ලබා ගැනීම සඳහා සංවිධානය කිරීම කාලෝචිතය යි තවත් අයෙක් කරුණු ඉදිරිපත් කරති. ශ්‍රී ලංකාවේ වැඩ කරන පිරිසෙන් බහුතරය ගොවීන් නිසා ඔවුන් තුළ සංවිධාන ව්‍යුහයක් ඇතිකිරීම කුමන ආකාරයකින් වුව ද වැදගත් යයි ඇතැම්හු කරුණු ඉදිරිපත් කරති.

ගොවීන් සංවිධානය කිරීම ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. ගොවීන්ගේ ම විවිධ ඕනෑ එපාකම් අනුව ද, රාජ්‍ය නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් අනුව ද, විවිධ ස්වේච්ඡා ආයතනවල මැදිහත් වීම නිසා ද ඇති වී, නැති වී ගිය විවිධ ගොවි සංවිධාන වැඩසටහන් රාශියක අත්දැකීම් ශ්‍රී ලංකාව සතුව ඇත. රුපියල් කෝටි ගණනින් මුදල් වැයකොට මහා පරිමාන මට්ටමින් දියත් කළ ගොවි සංවිධාන වැඩ සටහන්වල ද, විවිධ ස්වේච්ඡා ආයතනවල ආධාර උපකාර මත දියත් කළ මධ්‍යම පරිමාන ගොවි සංවිධාන වැඩ සටහන්වල ද කටයුතු තවමත් මූළුමනින් නටඹුන් වී නැත. මිණිපේ, ගල්ඔය, කිඹුල්වානාඔය, නාගදීපය, පිඹුරුත්තැව, ගල්ගමුව වැනි ප්‍රදේශවල පර්යේෂණ මට්ටමින් ඇති කළ ගොවි සංවිධාන ද, ඉඩම් අමාත්‍යාංශයේ වාරිමාර්ග කළමණාකරන අංශය විසින් ක්‍රියාත්මක කරන ගොවි සංවිධාන ද විවිධ මට්ටම්වලින් අදටත් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ සියළුම පළාත්වල ගොවීන් සංවිධානය කිරීමට අදහස් කර ඇති මේ යුගයේදී පසුගිය වකවානුව තුළ ගොවි සංවිධාන තුළින් අප ලැබූ අත්දැකීම් අමතක කළ යුතු නොවේ. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව 1979 දී පමණ ගල්ගමුව, උස්ගල සියඹලන්ගමුව, මහගල්කඩවල වැනි ප්‍රදේශවල ආරම්භ කළ ගොවි සංවිධාන 1985 පමණ වන විට මුළුමනින්ම අක්‍රියව තිබූ අතර නැවතත් 1986 දී වෙනත් ව්‍යාපෘතියක් යටතේ එම ප්‍රදේශ තුළම ගොවි සංවිධාන පිහිටුවනු ලැබීය. එහෙත් 1989 කරනු ලැබූ සොයාබැලීමක් අනුව හොඳින් ක්‍රියාත්මක වූ එකද ගොවි සංවිධානයක්වත් සොයා ගැනීමට නොහැකි තරමට අදල ප්‍රදේශයේ ගොවි සංවිධාන නැවතත් දූර්වලව පැවැතුනි. මේ නිසා යමෙකුට අවශ්‍ය නම්, මුදල් ආධාර තිබේ නම්, නැවතත් එම ප්‍රදේශ තුළම ගොවි සංවිධාන වැඩ සටහන් දියත් කළ හැකිය. එහෙත් තවත් වසර පහකින් පමණ පසු නැවතත් ගොවි සංවිධාන එම ප්‍රදේශයේම ඇති කිරීමට මුදල් සොයා ගන්නේ කෙසේද යන්න ගැන දැන් සිටම කල්පනා කළයුතු කරුණකි.

රටපුරා ගොවි සංවිධාන ඇති කිරීම ඉතා ''හොඳ'' දෙයකි. එය ''හොඳ දෙයක්'' වුව ද ''හොඳ'' යන්නේ ප්‍රායෝගිකත්වය විග්‍රහ කරන විට අප බොහෝ ආකුල ව්‍යාකුල තත්ත්වයකට පත්වේ. එක් පැත්තකින් බලන විට එය ගොවියාට හොඳය. ගොවියාගේ නිෂ්පාදනටලව සාධාරණ මිළක් ලබා ගැනීමට' පොහොර, කෘමිනාශක ආදි කෘෂි යෙදවුම් කලට වේලාවට ලබා ගැනීමට, කෘෂි උපදෙස් හා තාක්ෂණය කාර්යක්ෂමව ලබා ගැනීමට ගොවි සංවිධාන උපකාර වේ. අනෙක් පැත්තෙන් ගොවි සංවිධාන නිලධාරීන්ටත් හොඳය. ඔහුගේ සේවාවන් පහසුවෙන් ගොවියාට ලඟාකර දීමටත්, යහපත් ගොවි නිලධාරි සම්බන්ධයක් පවත්වා ගෙන යාමටත් ගොවි සංවිධාන උපකාර කරගත හැකි බැවිනි. රටේ ජාතික ආර්ථික සංවර්ධන කාර්යයෙහිලා ගොවි සංවිධානවලින් වැදගත් මෙහෙයක් අපේක්ෂා කළ හැකි බැවින් සාර්ව මට්ටමෙන් බලනවිට ගොවී සංවිධාන රටටත් හොඳය. එහෙත් මේ සියළුම පරමාර්ථ අන්තර්ගත වූ බොහෝ ගොවි සංවිධාන වැඩසටහන් එම වැඩසටහන් ක්‍රියාත්මක කළ නියමුවන් ඉවත් වූ විට, සමහර අවස්ථාවක ඒවායේ නියමුවන් සිටියදීම ක්‍රමයෙන් දිය වී ගිය බව මෙරට ගොවි සංවිධාන ඉතිහාසයෙන් අපට පැහැදිළි වී හමාරය. මේ නිසා රට පුරා ගොවි සංවිධාන කඩිනමින් පිහිටුවීමත් සමඟම ඒවායේ අනාගත පැවැත්ම තහවුරු කරන්නේ කෙසේද යන්න පිළිබඳව පෙරට වඩා අද විමසිලිමත් විය යුතුය.

ලංකාවේ ගොවි සංවිධාන වැඩ සටහන් සමස්ථයක් වශයෙන් ගත් විට අසාර්ථක ප්‍රයත්නයක් සේ පෙනුන ද, යම් යම් විශේෂිත ප්‍රදේශවලදී, විශේෂිත කාලවලදී හා විශේෂිත ප්‍රශ්නවලදී ඇතැම් වැඩසටහන් අතිශයින් සාර්ථක වූ අවස්ථා ද අපේ ඉතිහාසයෙන් සොයා ගත හැකිය. මේ නිසා රට පුරා නව ගොවි සංවිධාන ක්‍රමයක් ඇතිකිරීමේදී අපේ උත්සාහයන් ඵල දැරූ තැන් පිළිබඳ වැඩියෙන් සොයා බලා ඒවාට හේතු භූත වූ කරුණු මොනවාදැයි අලුත් වැඩසටහන්වලට ඇතුලත් කිරීම වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නන්ට මෙන්ම ගොවියාටත් ප්‍රයෝජනවත් වේ.

''පීඩා'' සංවර්ධන පර්යේෂණ ආයතනයේ අනුග්‍රහය මත රත්න ප්‍රදේශයේ එළවළු ගොවීන් පිහිටුවා ගනු ලැබූ ගොවි සංවිධාන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වූ බවත්, සාර්ථක ප්‍රතිඵල ගොවීන්ට අත්කර දුන් බවත් අප අත්දැක්කෙමු. 1981-1984 කාලය තුළදී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ගල්ඔය වම් ඉවුරේ සාර්ථකව ක්‍රියාත්මක කළ ගොවි සංවිධාන ද තවත් එවැනි අත්දැකීමකි. 1984 වර්ෂයේ දී ගල්ඔය වම් ඉවුර ප්‍රදේශයෙහිම කිසියම් කණ්ඩායමක් විසින් පිහිටුවීමට උත්සාහ ගත් ''ස්වාධීන ගොවි සංවිධාන ක්‍රමය'' නම් ගොවි සංවිධාන වැඩසටහනේ පැවැත්ම තිබුණේ මාස කීපයක් පමණි. මේවා පිහිටුවනු ලැබූයේ රජයේ අනුග්‍රහය මත පිහිටුවන ගොවි සංවිධාන මඟින් ගොවියාගේ ස්වාධීනත්වය ආරක්ෂා නොවන බවට ඔවුන් තුළ තිබූ විශ්වාසයත්, දිගුකල් පැවැත්මක් ඇති සංවිධාන බිහි කිරීමට නම් රජය මැදිහත් නොවිය යුතුය යන විශ්වාසයත් මතය. එහෙත් සිදුවුනේ රාජ්‍ය අනුග්‍රහය සහිත සංවිධාන සාපේක්ෂ වශයෙන් දිගුකල් පවතීමත්, ස්වාධීන ගොවි සංවිධාන මාස කීපයකින් අවසන් වීමත් ය. මේ නිසා රට පුරා නව ගොවි සංවිධාන බිහි කිරීමට සැලසුම් කරන මේ යුගයේ අපේ පැරණි අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව අප නැවතත් සිතට ගත යුතුය.

පසුගිය කාලය තුළදී ලංකාවේ ක්‍රියාත්මක වූ විවිධ ගොවි සංවිධාන වැඩ සටහන් වලින් ලැබූ අත්දැකීම් මත දිගු කල් පැවැත්මක් ඇති සංවිධාන බිහි කිරීම සඳහා ඉවහල් විය හැකි මූලික කරුණු කීපයක් නම් කළ හැකිය.

## (අ) ගොවි සංවිධාන ආර්ථික ප්‍රතිලාභ සහිත විය යුතුය

මෙම මූලික කරුණු පිළිබඳව අළුතින් කිව යුතු දෙයක් නැතැයි කෙනෙකුට නිතැතින්ම සිතෙනු ඇත. එනම් ආර්ථික වාසි ලබා දීමට මිස වෙනත් විනෝද කටයුත්තක් සඳහා ගොවි සංවිධාන පිහිටුවීමට අදහසක් නැති බැවිනි. තව දුරටත් කියනවා නම් 'ගොවි සංවිධාන වල පරමාර්ථවලින් බොහොමයක් ගොවියාගේ හා රටේ ආර්ථික අභිවෘද්ධිය සඳහාම යොමු වී ඇති බැවිනි. එහෙත් ප්‍රශ්නය නම් මීට පෙර පිහිටවූ ගොවි සංවිධාන දිය වී ගියේ එවැනි පරමාර්ථ නොතිබූ නිසා ද? යන්නයි. එම සංවිධානවලට ද එවැනිම පරමාර්ථ රාශියක් තිබුනි. එහෙත් සංවිධාන දිය වී ගියේ අරමුණු හා පරමාර්ථ තිබූ පමණින්ම ගොවීන් ප්‍රතිලාභ ලබන්නන් බවට පත් නොවූ බැවිනි. ගොවීන් ප්‍රතිලාභීන් නොවූ බව කීම මුළුමනින් නිවැරදි කිය මනක් නොවේ. මක් නිසාදයත් ඒ යම් යම් අර්ථ දැක්වීම අනුව ගොවීන් ප්‍රතිලාභීන් බවට විශේෂඥයන්ට නිර්වචනය කළ හැකි බැවිනි. කෙසේ වෙතත් ගොවීන් ඔවුන් විසින්ම විස්තර කර ගන්නා පරිදි නැතහොත් තේරුම් ගන්නා පරිදි ඔවුහු ප්‍රතිලාභීන් වී නැත.

කල් පවත්නා ගොවි සංවිධාන බිහි කිරීමට නම් එම සංවිධානවලින් ගොවීන්ට ලැබෙන සමාජ–ආර්ථික ප්‍රතිලාභ නිශ්චිත විය යුතු අතර ඒවා වර්ග කර, නම්කර දැක්විය හැකි විය යුතුය. යම් විටෙක ප්‍රතිලාභ හීනවන්නේ නම්, ක්ෂය වන්නේ නම් සංවිධානය ද හීන වී ක්ෂය වී යනු ඇත. ගල්ඔය ගොවි සංවිධාන ආරම්භ කළ යුගයේ ප්‍රදේශයේ පැවැති වාරිමාර්ග ජල ප්‍රශ්නය හා පුනරුත්ථාපන වැඩසටහන පසුබිම් කොට ගොවීන් තුළ තිබූ උනන්දුව මත ගොවි සංවිධාන අතිශයින් සාර්ථකව ක්‍රියාත්මක වූ අතර පුනරුත්ථාපන වැඩසටහනින් පසු ජල ප්‍රශ්න මෙන්ම ඇළ වේලි හා ඉදිකිරීම් පිළිබඳ ප්‍රශ්නද විසඳුනු බැවින් බිහි කරනු ලැබූ සංවිධාන ක්‍රමයෙන් අඩපන වන්නට විය. ගැටළුවක් ඇති විට පමණක් සංවිධානයවීම සාමාන්‍ය මිනිසාගේ හැසිරීම බැවින් ගොවීන් පමණක් වෙනත් අයුරකින් හැසිරේ යයි අපේක්ෂා කර ගොවි සංවිධාන ඇති කිරීමට කටයුතු නොකළ යුතුය. කල් පවත්නා ගොවි සංවිධාන ඇති කිරීමට නම් ප්‍රතිලාභ අඛණ්ඩව ලැබෙන සැළැස්මක් තිබිය යුතු අතර නැතහොත් එක් ප්‍රතිලාභයකින් වෙනත් ප්‍රතිලාභයකට මාරුවන පරිදි හෝ ගොවියා නිරන්තරයෙන් සංවිධානයට බැඳගැනීමට තරම් වැඩසටහන සමත් විය යුතුය.

ගොවි සංවිධාන සම්බන්ධ ප්‍රතිලාභ පිළිබඳව සාකච්ඡා කරන විට මතුවන තවත් ගැටළුවක් නම් ප්‍රතිලාභ නිර්වචනය කරන්නේ කෙසේද යන්නයි. සංවිධාන බිහිකිරීමේ නියැලී සිටින ඇතැම් විශේෂඥයන් දක්වන පරිදි සංවිධාන මගින් ගොවියාට පුද්ගලිකව ප්‍රතිලාභ අත් නොවූවත්, පොදුවේ ප්‍රදේශයට, වාරි පද්ධතියට හෝ රටට ආදී වශයෙන් ප්‍රතිලාභ හිමි වේ. මේ පදනම මත ගොවි සංවිධාන ඇති කිරීම සුදුසුය. එමෙන්ම එම ප්‍රතිලාභ මත ගොවීන් සංවිධාන විය යුතුය. එම ප්‍රතිලාභ මත ගොවීන් සංවිධාන කළ හැකිය. හා ඒවා දිගු කල් පවත්වා ගෙන ද යා හැකිය. නමුත් පසුගිය දශක එකහමාරක (1 1/2) කාලය තුළ ලැබූ අත්දැකීම්වලින් පෙනී යන්නේ ගොවියා හැසිරෙන්නේ ගොවියාට උවමනා ආකාරයට විනා විශේෂඥයාගේ නිර්වචනයට අනුව හෝ ඔහුගේ බලපත්‍රය ලැබුණු පොදු පරමාර්ථවල නියැලීමට හෝ නොවේ. අප විසින් ගොවියා කෙසේ තේරුම් ගනු ලැබූවත් ඔහු හේතුවාදීව කටයුතු කරයි. නිශ්චිත ගැටළුවලදී, නිශ්චිත අවස්ථාවලදී, නිශ්චිත අරමුණු සඳහා හේතුවාදී පදනම් මත එදත් ගොවියා සංවිධානය විය. අදත් එවැනි පදනම් මත සංවිධාන කළ හැකිය. මේ ගොවීන්ගේ බහුතරයේ හැසිරීමයි.

ඇතැම් විට ගොවීන් දිගුකාලීන ප්‍රතිලාභ සඳහා හෝ පොදු සමාජ ප්‍රතිලාභ සඳහා හෝ සංවිධාන කළ නොහැක්කේ නොවේ. එහෙත් එහි සාර්ථකත්වය තීරණය වන්නේ ඔහු ජීවත්වන ජන සමාජයේ වෙනත් පුද්ගලයන්ගේ හා ආයතනවල හැසිරීම ඔහු දිරිගන්වන්නේ නම් හා ඔහුට අනුග්‍රහය දක්වන්නේ නම් පමණි. ගල්ඔය වාරිමාර්ග පුනරුත්ථාපන වැඩසටහන යටතේ ගොවීන් රුපියල් දශ ලක්ෂ ගණනක වටිනාකමින් යුතු ශ්‍රමදාන කරනු ලැබුයේ මුල් යුගයේ ලැබුණු දිරිගැන්වීම හා අනුබල දීම නිසාය. එහෙත් නිලධාරියාගේ අරමුණු වෙනස් නම්, රාජ්‍ය දේපල පාවිච්චියේ ස්වභාවය පිළිබඳව ඔහු සෑහීමකට පත් නොවන්නේ නම්, නාස්තිය හා දූෂණය ඉහවහ ගොස් තිබේ නම් ගොවියා පමණක් රට වෙනුවෙන් හෝ පොදු පරමාර්ථ වෙනුවෙන් කැපවිය යුතු යැයි අපට සිතිය හැකිද? මෙවැනි පදනමක් මත ගොවියා අප සමග සිටින්නේ ඉතා සුළු කාලයකට පමණි. බොහෝ විට මාස කීපයකට පමණි. අපේ සුරංගනා කථාවලට රැවටීමෙන් හෝ අප දේශනා කරන මනඃකල්පිත ගොවි ආධිපත්‍යයකට ගිජුවීමෙන් හෝ ගොවීන් සංවිධාන වන්නේ නැත.

ප්‍රතිලාභ පිළිබඳව සැලකීමේදී වැදගත් වන තවත් කරුණක් නම් සංවිධාන නිසා ගොවියාට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණාත්මක වශයෙන් වැදගත් ද යන්නයි. වෙනත් වචනවලින් කියතොත් ගොවි සංවිධානවල කටයුතුවල නියැලීම සඳහා ඔහු මිඩංගුකරන කාලය ඔහුගේ එදිනෙද කටයුතුවලට යොදවන්නේ නම් ඔහුට වඩා වාසිදයක වන්නේ කුමක් ද? යන්නයි. ගොවියා වගාකරුවකු මෙන්ම බොහෝ විට පවුලේ ප්‍රධානියාද වෙයි. මේ නිසා පොහොර යෙදවීම්, කෘෂි රසායන යෙදීම්, පැල සිටුවීම් වැනි ගොවිතැනට සම්බන්ධ කරුණුවලට අමතරව පවුලේ වෙනත් අවශ්‍යතා, එනම්, දූ දරුවන් පිළිබඳ කටයුතු, අවස්ථාවක් ලද විට වෙනත් දෛනික ආදයම් ලබාදෙන කුලී වැඩ ආදියෙහි යෙදීම ද ඔහුගේ දෛනික ජීවිතයට අඩංගු කරුණුය. මේ නිසා ගොවි සංවිධාන රැස්වීමකට, සාකච්ඡාවකට, පුහුණුවකට, සහභාගී වීමට පෙර ඔහු තමා ඊට සහභාගී වෙනවාද වෙනත් කටයුත්තක යෙදෙනවාද යන්න තීරණය කරන්නේ කාර්යයන් දෙකෙන් ඔහුට වඩා වැදගත් දෙය මැන බැලීමෙනි. ''ඔය රැස්වීම්වලට යනවාට වඩා හොඳයි මොකක් හරි කුලියක් කරලා කීයක් හරි හොයා ගන්නවා'' යනුවෙන් ගොවීන් බොහෝ විට ප්‍රකාශ කරන්නේ එබැවිනි. ගොවි සංවිධානවලින් ප්‍රතිලාභ නොලැබෙන්නේ නොවේ. එහෙත් ඒවා ගොවියාගේ වර්තමාන දෛනික චර්යාව වෙනස් කිරීමට තරම් කිසිසේත් ප්‍රමාණවත් නොවන බව ගොවියාගේ අදහසයි. උදහරණයක් වශයෙන් පසුගිය කාලවල ක්‍රියාත්මක වූ ගොවි සංවිධාන වැඩසටහන් බොහොමයකින් ඉස්මතු කර පෙන්වූ ප්‍රතිලාභයක් නම් ගොවියාට කලට වේලාවටත්, පහසුවටත්, පොහොර, කෘමිනාශක වැනි යෙදවුම් ලබා ගැනීමට හැකිවන බවයි. එහෙත් රටේ පැවැති නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය අනුව ගොවියාට මුදල් තිබුනා නම් පොහොර, කෘමිනාශක ලබාගැනීමට පුද්ගලික වෙළඳසැල් ඕනෑ තරම් තිබුනි. මුදල් නැති ගොවියාට සංවිධාන තිබුණත් නොතිබුනත් පොහොරවත් කෘමිනාශකවත් ලැබුනේ නැත. මේ පිළිබඳව ගොවීන්ගෙන් කරුණු විමසූ කීප අවස්ථාවකම අසන්නට ලැබුනේ ''සල්ලි තියෙනවා නම් පොහොර, ගන්න අපිට සංවිධාන ඕනෑ නැහැ. මහත්තයෝ'' යන්නයි.

## (අ) ගොවි සංවිධායකවරුන් දිරිමත් කළ යුතුය.

අප බොහෝවිට ගොවි සංවිධාන ගැන සාකච්ඡා කරනවා විනා එම කාර්ය සඳහා ගොවීන් පොළඹවන සංවිධායකවරයා ගැන හෝ නිලධාරියා ගැන කථා කිරීම අතපසු කර ඇත. ගොවීන් සංවිධානය කිරීම සඳහා මඟ පෙන්වීමට, පෙළඹවීමට හැම විටම ඒ සඳහාම වෙන් වූ සංවිධායකයකු අවශ්‍ය නොවේ. ක්ෂේත්‍ර මට්ටමේදී ක්‍රියාත්මක වන රජයේ නිලධාරියකුට ද මේ කාර්ය සාර්ථකව කළ හැකිය. හොඳම උදාහරණය නම් කිඹුල්වානඔය වාරි යෝජනා ක්‍රමයේ කාර්මික නිලධාරියකු විසින් ජල පාලනය හා පද්ධතිය නඩත්තු කිරීම සඳහා සාර්ථක ගොවි සංවිධාන ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබීමයි. මිණිපේ යෝජනා ක්‍රමයේදී ද රජයේ නිලධාරීන් විසින් ඉතා සාර්ථකව ගොවීන් සංවිධානය කළ අවස්ථාවක් වාර්තා වී ඇත. මේ හැරුණු විට නිලධාරීන්ගේ ස්ව කැමැත්ත මත ගොවීන් සංවිධානය කළ අවස්ථාවන් අපේ ගොවි සංවිධාන ඉතිහාසයේ ඇතොත් ඒ ඉතා විරල වශයෙනි. මෙහිදී මතුවන ගැටළුව නම් කිඹුල්වාන, මිණිපේ, මෙන් අනෙක් ප්‍රදේශවල නිලධාරි මහතුන්ට මෙවැනි ස්වේච්ඡා කටයුත්තක යෙදිය නොහැකි ද යන්නයි.

මේ පිළිබඳව කරන ලද සොයා බැලීම්වලදී පැහැදිළිව පෙනුන දෙයක් නම් ගොවීන් වෙනුවෙන් කැප වීමෙන් කට යුතු කරන නිලධාරියාත්, රැකියාව සඳහා පමණක් තම කාර්ය කරන නිලධාරියාත් වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමයක් හෝ අගය කිරීමේ ක්‍රමයක් අපේ පරිපාලන රටාව තුළ ක්‍රියාත්මක නොවන බවයි. උසස් වීම්, ශිෂ්‍යත්ව ආදී සියළුම වරප්‍රසාද නිලධාරියාට ළහාවනුයේ වෙනත් දෘශ්‍ය හා අදෘශ්‍ය සාධක මත මිස ඔහුගේ කැප වීම හා වෙනත් ගුණාංග මත නොවේ. මේ නිසා නිලධාරියාගේ කාර්යක්ෂමතාව, මැනීමට ඉවහල් කරගනු නොලබන මිනුම් දඬු යටතට එන ගොවි සංවිධාන කටයුතු ආදියෙහි යෙදීම හුදෙක් ඇතැම් නිලධාරීන් තුළ තිබෙන කැපවීම හා මිනිස්කම විදහාපාන ලක්ෂණයක් විනා පවතින පරිපාලන රටාව විසින් ඔහු පෙළඹවීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් නොවේ. එබැවින් කල්පවතින ගොවි සංවිධාන පිහිටුවීමට නම් පවතින නිලධාරි ඇගයුම් ක්‍රමය, නව පරමාර්ථවලට, බලාපොරොත්තුවලට අනුරූප වන පරිදි වෙනස් කළ යුතුය. නැතහොත් නව ක්‍රියා මාර්ග හා පවතින ක්‍රමය අතර ඇති පරස්පර විරෝධතාවයන් නිසා කිසිදු ක්‍රමයක් හෝ සාර්ථකව ක්‍රියාත්මක නොවී සමස්ථ ගොවි සංවිධාන වැඩ පිළිවෙලම අවුල් ජාලයක් බවට පත් වනු ඇත.

## (ඇ). පාරිසරික තත්වයන් හා නීතිමය තත්ත්වයන් හිතකර විය යුතුය

විවිධ ව්‍යාපෘති යටතේ පසුගිය කාලය තුළ පිහිටුවනු ලැබූ ගොවි සංවිධාන ඉතා සුළු කාලයක් තුළදී දිය වී යාමට හේතු වුණ ප්‍රධානතම සාධකයක් වූයේ ගොවි සංවිධානවල පරමාර්ථ, බලාපොරොත්තු හා ඒවායේ ක්‍රියාකාරකම්වලට පරස්පර විරෝධතාවයක්, පවත්නා සමාජ-ආර්ථික රටාව තුළම පැවතීමයි. කෘෂිකර්මයට අදාළව රටතුළ පැවැති අභ්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තිය දෙස බැලුවත්, ගොවි ආර්ථිකයට බලපෑම් කළ හැකි විදේශ වෙළඳ ප්‍රතිපත්ති දෙස බැලුවත්, ප්‍රයෝජනයට ගැනුණු කෘෂි තාක්ෂණය දෙස බැලුවත්, ගොවීන් ඒකරාශී කරන ලක්ෂණවලට වඩා පුද්ගලිකත්වය හා තරඟකාරීත්වය ඉස්මතු කරන ලක්ෂණ බහුල විය. අනෙක් අතින් පවතින නිලධාරි රටාව නිසාද, ගොවි සමාජය තුල මුල් බැසගත් දේශපාලනමය බෙදීම් නිසාද, පංතිමය හා සමාජමය නොගැලපීම් නිසාද අඳක්‍රම හා උකස් ක්‍රම ආදී ඉඩම් භුක්තිය පිළිබඳ විෂමතාවයන් නිසාද, කඩා වැටුනු හෝ දිය වී ගිය ප්‍රජා සංවිධානවලින් ගොවීන් ලබා තිබූ නිස්සාර අත්දැකීම් නිසාද, ගොවි සංවිධාන විෂයෙහි දී ගොවියා නොසෙල්වී සිටියා හෝ පියවර මැන්න මිස වේගයෙන් ඉදිරියට ගමන් කළේ නැත. මේ නිසා පැවතුනු ගොවි සංවිධාන නොගැලපෙන දුතිරෝද යෙදූ යන්ත්‍රයක් මෙන් ආයාසයෙන් කෙටි දුරක් ගමන් ගත්තා විනා නිරායාසයෙන් හා සුමටව සමාජ-ආර්ථික රටාව තුළ පහසුවෙන් ක්‍රියාත්මක වූවක් නොවීය.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ
අංශ ප්‍රධාන (පුහුණු)

**අයි. රණසිංහ පෙරේරා**
විසිනි.

නීතිමය තත්ත්වයන් පිළිබඳව සලකා බලන විට වුවද මෙතෙක් ක්‍රියාත්මක කරනු ලැබූ කිසිදු ගොවි සංවිධානයකට තම අනන්‍යතාව හෝ බලපෑම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් නීතිමය රැකවරණයක් නොතිබිණි. මේ හේතුව නිසාම ඇතැම් ගොවි සංවිධානවල කාර්යයන් අඩපන වී ගිය අතර සංවිධාන පසුගාමී තත්ත්වයකට ඇද වැටුනි. උදාහරණයක් වශයෙන් දක්වනවා නම් ගල්ඔය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වූ එක්තරා සංවිධානයක වාරි ගොවීන් විසින් ඇළවේලි ශුද්ධ නොකරන, වාරි ජලය උවමනාවෙන් අපතේ යවන දඩබ්බර ගොවියෙකුගේ වතුර බටය තාවකාලිකව වසා දැමීමට ඒකමතිකව තීරණය කරන ලද නමුත් එවැනි තීරණ ගැනීමේ නීත්‍යානුකූල අයිතියක් ගොවි සංවිධානවලට නොතිබූ බැවින්, සියළුම ශිෂ්ට සම්පන්න ගොවීන් අභිබවා දඩබ්බර ගොවියා ජයග්‍රහණය කළා පමණක් නොව ඒ හේතුවම මූලික කොටගෙන ශක්තිමත් සංවිධානය දුර්වල සංවිධානයක් බවට ද පරිවර්තනය විය. එහෙත් අපේ ඉපැරණි වාරි-කෘෂිකාර්මික ඉතිහාසය මීට වෙනස්ය. ''නියර ඉස්වසා වතුර ගිය වරදට අක දෙකක දඩයක්ද, පමා වී සීසෑ වරදට අක දෙකයි කළං පහක දඩයක් ද අය කළ යුතුය. '' (කොන්ඩවටුවාන සෙල්ලිපිය) 4 වැනි දප්පුල මහරජු, (ක්‍රි.ව. 924--935).

මේ අප දැක්වූයේ පසුගිය දශක එක හමාරක (1 1/2) පමණ ඉතිහාසයෙන් ගොවි සංවිධාන පිළිබඳව අප ලැබූ පාඩම් වලින් කීපයකි. දියුණු වූ හැම විෂයක්ම, කාර්යක්ම අදල දියුණුවේ අඩිතාලම දමාගත්තේ ඉතිහාසයෙන් ලත් අත්දැකීම් මතය. මේ නිසා ගොවි සංවිධාන සම්බන්ධයෙන් ද මේ සත්‍ය නිරවද්‍ය යැයි සිතිය හැකිය. ගොවි සංවිධාන පිහිටුවිය යුත්තේ ගොවීන් සඳහා මිස වෙනත් ආයතනයක්, රජයේ හෝ දේශපාලන කණ්ඩායමක් සතුටු කිරීමට නොවේ. මේ නිසා පැරණි වැරදි නැවත නොකිරීමටත්, උගත් පාඩම් අළුත් වැඩසටහන්වලට ඇතුල් කිරීමටත් අප වගබලා ගත යුතුය. එය පර්යේෂකයාටත්, ප්‍රතිපත්ති සම්පාදකයාටත් කර ඇරිය නොහැකි වගකීමකි. *